*සියලු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ...

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| ශ්‍රේණිය Grade | 10 | විෂයය Subject | ශිල්ප කලා | කාලය Time | පැය 03 |
|---|---|---|---|---|---|

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. රට ස්වාධීනත්වය කියාපාන කැඩපතක් ලෙස ''ජන කලාව'' හඳුන්වයි. මේ සම්බන්ධයෙන් විවිධ මත ඉදිරිපත් වී ඇත. ''කලාවෙන් සතුට ගෙන දේ'' යන්න පවසන්නේ,
    1. හෙන්රි ජයසේන මහතා
    2. ආනන්ද සමරකෝන් මහතා
    3. ආනන්ද කුමාරස්වාමි මහතා
    4. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

02. මිනිසුන්ගේ අවශ්‍යතා මත බිහි වූ කලාවක් ලෙස ජන කලාව හැඳින්වේ. ඒ අනුව ජන කලාව ප්‍රධාන කොටස් 3 කට බෙදෙයි. එනම්,
    1. ශ්‍රව්‍ය කලාව, විදග්ධ කලාව, දෘශ්‍ය කලාව
    2. ශ්‍රව්‍ය කලාව, ජන කලාව, විදග්ධ කලාව
    3. ශ්‍රව්‍ය කලාව, දෘශ්‍ය කලාව, ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව
    4. ජන කලාව, ශ්‍රව්‍ය කලාව, දෘශ්‍ය කලාව

03. වෙස් මුහුණු කලාව හා රූකඩ කලාව සමීප කලාවන් දෙකකි. ඒ අනුව වෙස් මුහුණු කැපීමට බහුලව යොදාගනු ලබන්නේ,
    1. කඳුරු, රුක් අත්තන, එරබදු වැනි ලී වර්ග
    2. කොස්, බුරුත, නැදුන් වැනි ලී වර්ග
    3. කැන්ද, හල්මිල්ල, තේක්ක වැනි ලී වර්ග
    4. නැදුන්, තේක්ක, කොස් වැනි ලී වර්ග

04. රේඛාවක් සමාන කොටස්වලට බෙදීමේදී අවශ්‍ය වන උපකරණ කට්ටලයට අයත් වන්නේ,
    1. කවකටුව, අඩිරූල, කෝණමානය
    2. කවකටුව, විහිත චතුරස්‍රය, අඩි රූල
    3. කවකටුව, කෝණමානය, බෙදුම්කටුව
    4. කවකටුව, විහිත චතුරස්‍රය, කෝණමානය

05. වෘත්ත නිර්මාණයේ දී, අරයන් දෙකකින් හා ඒ තුළ වූ චාපයකින් වෙන් වූ කොටස හඳුන්වනු ලබන්නේ,
    1. වෘත්ත ඛණ්ඩය ලෙස
    2. කේන්ද්‍රික ඛණ්ඩය ලෙස
    3. ජ්‍යාය ලෙස
    4. විෂ්කම්භය ලෙස

06. යම් කිසි අචල ලක්ෂයකට සමදුරින් එකම තලයක් මත චලනය වන ලක්ෂයක පථය ලෙස හඳුන්වනු ලබන්නේ,
    1. වක්‍ර පෘෂ්ඨය ලෙස
    2. ඉලිප්සය ලෙස
    3. වෘත්තය ලෙස
    4. සංවෘත රූපය ලෙස

07. ලාක්ෂා නම් කුඩා කෘමියෙකුගේ සිරුරෙන් නිකුත් වන ලාටු විශේෂය ඝන වූ පසු ලාක්ෂා නිෂ්පාදනය කරනු ලබයි. ලාක්ෂා කෘමියා ජීවත් වන ශාක විශේෂය වන්නේ,

1. ග්ලිඩිසීරිය, කෝන්, කජු  2. කජු, කැන්ද, කෝන්
3. කෝන්, තලකීරිය, කජු  4. කැප්පෙටිය, කෝන්, තලකීරිය

08. රෙදි පිළි අලංකරණයේ මූලිකම දෙයකි වර්ණ. ඒ අනුව මූලික වර්ණ 3 වනුයේ,

1. නිල්, කහ, රතු  2. රතු, සුදු, කළු
3. රෝස, දම්, කොළ  4. දම්, කොළ, තැඹිලි

09. රෙදිපිළි පින්තාරු කිරීමේ දී වර්ණ මෙන්ම පින්සලයද වැදගත් වේ. අදාල කාර්යයට අනුව පින්සලය තෝරා ගත යුතුය. ඒ අනුව ''සියුම් ඉරි, කුඩා තිත්'' ආදිය ඇඳීමට ගතයුතු පින්සලය වන්නේ,

1. අංක 00 - 03 දක්වා පින්සල  2. අංක 04 - 09 දක්වා පින්සල
3. පැතලි පින්සල්  4. විශාල සේදුම් පින්සල්

10. අතීත මිනිසා වර්ණ සෑදීමට පරිසරයේ ඇති බොහෝ දේ ප්‍රයෝජනයට ගෙන ඇත. එහෙත් මෙරටට ආනයනය කරන ලද ද්‍රව්‍යයකින් ද වර්ණ සාදා ඇත. එම වර්ණය වන්නේ,

1. කළු  2. සුදු  3. රතු  4. කහ

11. කපු කෙඳිවල ස්වභාවිකව ඇති ඉටි බාහිරින් එකතු වූ අපද්‍රව්‍ය ඉවත් කිරීම හඳුන්වනු ලබන්නේ,

1. මලහරණය  2. වර්ණ ගැන්වීම  3. කැඳහරණය  4. විරංජනය

12. කෙඳි හඳුනා ගැනීම සඳහා කරනු ලබන ක්‍රම අතරින් පිළිස්සීමේ පරීක්ෂාවේ දී කහ පාට ලොකු ගිණිසිළු දක්නට ලැබෙන කෙඳි වර්ග වන්නේ,

1. සේද කෙඳි  2. කපු කෙඳි  3. ලෝම කෙඳි  4. ලිනන් කෙඳි

13. ලෝකයේ නිපදවනු ලබන රෙදිවලින් වැඩි ප්‍රමාණයක් කපු රෙදිය. ඒ අනුව ඉතාම උසස් ම කපු වර්ගය වන්නේ,

1. සී අයිලන්ඩ් කපු  2. ඉන්දියන් කපු
3. පීලර් කපු  4. ඇමෙරිකන් උස්බිම් කපු

14. සායම් කිරීම සඳහා යොදාගන්නා රෙදිවල ස්වභාවිකව පවතින දුඹුරු පැහැය ඉවත් කිරීමේ පෙර පිරියම් ක්‍රමය වන්නේ,

1. කැඳහරණය  2. වාෂ්පීකරණය  3. විරංජනය  4. මලහරණය

15. විසිතුරු පටි විවීම සඳහා ටැබ්ලට් උපයෝගී කර ගනී. මෙහිදී විසිතුරු පටියේ පළල වැඩිකර ගැනීම කරනු ලබන්නේ,

1. ටැබ්ලට් සඳහා යොදාගන්නා නූල් සංඛ්‍යාව වැඩි කිරීම.
2. ප්‍රමාණයෙන් විශාල ටැබ්ලට් භාවිතයෙනි.
3. භාවිතාකරන ටැබ්ලට් ප්‍රමාණය වැඩි කිරීමෙනි.
4. ටැබ්ලටයක එන සිදුරු සංඛ්‍යාව වැඩි කිරීමෙනි.

16. ලිනන් හා සේද මිශ්‍රකර ''ග්‍රාස් ලිනන්'' රෙදි සඳහා යොදා ගන්නා කෙඳි ලබා ගන්නා ශාකය වන්නේ,

1. රැමි  2. සීසල්  3. පෙනා  4. ජූට්

17. උසස් වර්ගයේ ලෝම කෙඳි ලබා ගන්නා බැටළු විශේෂය වන්නේ,

1. දෙමුහුන් බැටළුවා  2. මස් බැටළුවා
3. දික්ලොම් බැටළුවා  4. මැරිනෝ බැටළුවා

18. රෙදිපිළි අලංකරණ ක්‍රම අතරින් අච්චු නිර්මාණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන තැනක් හිමි වේ. ඒ අනුව මේ සඳහා භාවිතා වන අච්චු වර්ග දෙකකි.

1. ස්වභාවික අච්චු හා නිර්මිත අච්චු  2. ප්ලාස්ටික් හා දැව අච්චු

3. ෆ්ලාස්ටර් ඔෆ් පැරිස් හා දැව අච්චු  4. ස්වභාවික හා දැව අච්චු

19. නියමිත ප්‍රමිතියට සකසන ලද $A_2$ කඩදාසියකින් ලබා ගත හැකි $A_4$ ප්‍රමාණයේ කඩදාසි සංඛ්‍යාව වන්නේ,

1. 2 කි.  2. 4 කි.  3. 3 කි.  4. 6 කි.

20. පහත දැක්වෙන රේඛා අතරින් සැඟිදාර දැක්වීමට යොදා ගන්නා රේඛා වර්ගය වන්නේ,

1. —·—·—·—·—·—·—·—·—·—·—  2. - - - - - - - - - - - - - - - - - - - -

3. —··—··—··—··—··—··—··  4. ————————————————

21. පෙහෙකම් කෙඳි නිෂ්පාදනයේදී ස්වභාවික සිල්ක් රෙදි හෙවත් සේද රෙදි නිපදවීම සඳහා කෙඳි ලබා ගත්තේ,

1. ස්වභාවික පෙලිමර මගින්  2. ෆ්ලැක්ස් ගසේ කෙඳි වලිනි

3. කාශ්මීර එළුවාගේ ලෝම වලිනි.  4. පටපණු කෝෂ වලිනි.

22. චාම් වියමන් රටාවේ ප්‍රභේදයක් වන බාස්කට්, හොප්සැක් යන නම් වලින් හඳුන්වන්නේ,

1. සරල හිරි වියමන  2. ජටා වියමන

3. කඩ හීරි වියමන  4. චාම් වියමන

23. වියමන් රටා ඇතිවනුයේ දික්නූල් හා හරස් නූල් අතර ඇතිවන බැඳීම අනුවයි. ඒ අනුව පාසල් නිල ඇඳුම් රෙදි සඳහා භාවිතා වන වියමන් රටාව වන්නේ,

1. චාම් වියමන  2. ජටා වියමන

3. හරස් දාර වියමන  4. දික් දාර වියමන

24. දික් නූල් හා හරස් නූල් අතර බැඳීම සිදුවන්නේ රටාවකට අනුවයි. පහත වියමන් රටාව හඳුන්වන නම වන්නේ,



1. චාම් වියමන

2. ජටා වියමන

3. දික්දාර වියමන

4. හරස් දාර වියමන

25. මෝස්තර සහිත රෙදි කැබලි රෙද්දකින් කපා ගෙන ඒවා වෙනත් රෙද්දක මතුපිට තබා මැසීමේ ක්‍රමය හඳුන්වන්නේ,

1. පැච්වර්ක් ක්‍රමය  2. නෙට්වර්ක් ක්‍රමය

3. තාප බන්ධිත ක්‍රමය  4. එම්බ්‍රොයිඩර් ක්‍රමය

26. වර්ණ සංකලනයේදී එළිය හා අඳුර ඇති කරගැනීම සඳහා මිශ්‍ර කරනු ලබන වර්ණක වන්නේ,

1. සුදු, කළු  2. සුදු, රතු  3. කළු, රතු  4. රතු, කළු

27. ගිනි නිවන හමුදාවේ කටයුතු සිදුකරන පිරිසගේ ඇඳුම් සඳහා භාවිතා කරනු ලබන කෙඳි වර්ග වන්නේ,

1. වීදුරු කෙඳි  2. කපු රෙදි  3. රන් කෙඳි  4. ඇස්බැස්ටෝස්

28. සේද කෙඳි වර්ග අයත්වන කෙඳි විශේෂය කුමක්ද ?

1. ප්‍රෝටීන්  2. බතික්  3. කෘත්‍රිම  4. සෙලියුලෝස්

29. ඇලුමිනියම් සිලිකේට් හෙවත් මැටිවල අඩංගු සංයෝග වන්නේ,

1. ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ්, ජලය
2. ටයිටේනියම්, ජලය, ඩොලමයිට්
3. සෝඩියම් සිලිකේට් , ජලය, ඇලුමිනියම් ඔක්සයිඩ්
4. පෙල්ස්පාර් , ඩොලයමයිට්, ජලය

30. විවිධ වෙත්තුන් මත පාෂාණ ජීර්ණය වී මැටි නිර්මාණය වී ඇත. ඒ සඳහා බලපාන මාතෘ පාෂාණය වන්නේ,

1. සිලිකා 2. ඇලුමිනියම් 3. ජලය 4. ෆෙල්ස්පාර්

31. මාතෘ පාෂාණ ජීර්ණය වීමෙන් මැටි නිර්මාණය වී ඇත. ඒ අනුව මැටි අංශුවක ප්‍රමාණය වන්නේ,

1. මිලි මීටර් 0.002 ට වඩා කුඩා කලිලමය අංශුවයි.
2. මිලි මීටර් 0.0002 ට වඩා කුඩා කලිලමය අංශුවයි.
3. මිලි මීටර් 0.020 ට වඩා කුඩා කලිලමය අංශුවයි.
4. මිලි මීටර් 0.200 ට වඩා කුඩා කලිලමය අංශුවයි.

32. පාෂාණ ජීර්ණය වීමෙන් මැටි නිර්මාණය වේ. ඒ අනුව ජීර්ණය වූ ස්ථානයේම තැන්පත් වන මැටි හඳුන්වන නම,

1. ද්විතියික මැටි 2. බෝල මැටි 3. ප්‍රාථමික මැටි 4. තලප මැටි

33. සංයුතිය අනුව මැටි වර්ග කර දන්වයි. ඒ අනුව මැටි බෙදෙන ප්‍රධාන කොටස් 2 වන්නේ,

1. කෙඹලින් හා අගම් මැටි 2. බෝල මැටි භාරත මැටි
3. තලප මැටි හා රතු මැටි 4. පිහිටි මැටි හා අගම් මැටි

34. මැටිවල භෞතික රසායනික ගුණ වන්නේ,

1. සුවිකාර්යතාවය, භංගුරතාව, තන්‍යතාව, හැකිලීම
2. සුවිකාර්යතාව, සවිවරතාව, හැකිලීම, වර්ණය
3. හැකිලීම, භංගුරතාව, වර්ණය, සුවිකාර්යතාව
4. භංගුරතාව, තන්‍යතාව, වර්ණය, සවිවරතාව

35. ද්විතියික මැටි භාවිතයෙන් කෙරෙන නිෂ්පාදනයක් වන්නේ,

1. දන්තාලේප 2. බෙහෙත් දවටන
3. රතු මැටි භාණ්ඩ 4. සෙරමික් භාණ්ඩ

36. ලංකාවේ ගුණාත්මක බවෙන් ඉහළ කෙඹලින් මැටි නිධිය පිහිටා ඇත්තේ,

1. මීටියාගොඩ 2. අම්බන්ගොඩ 3. බොරලැස්ගමුව 4. කැළණිය

37. ගිනි මැටි හෙවත් නොවිරෙන මැටි යොදා නිපදවනු ලබන්නේ,

1. ගුරුලේත්තු 2. දන්තාලේප 3. ගඩොල් 4. ගිනිකොත්

38. මැටි ගබඩා කරනු ලබන මැටි පෙට්ටිය හෙවත් මැටි ඔරුවෙහි ඇතුලත බිත්ති ආවරණය කර ඇත්තේ,

1. පොලිතින් වලිනි. 2. සින්ක් කහඩුවකිනි.
3. ලැලි වලිනි. 4. කඩදාසි වලිනි.

39. යන්ත්‍රානුසාරයෙන් මැටි පදම් කිරීමේදී නොලෙන සුළු අමුද්‍රව්‍ය කුඩු කර ගැනීමට භාවිත කරන යන්ත්‍රය වන්නේ,

1. ජෝ ක්‍රෂර් 2. බෝල් මිල් 3. ෆිල්ටර් ෆ්‍රෙෂ් 4. පග්මිල් යන්ත්‍රය

40. පාෂාණ ජීර්ණය වීමේ ක්‍රියාවලියට බලපාන සාධක ඇතුළත් වන්නේ,

1. සූර්ය තාපය, වර්ෂාව, විදුලි කෙටීම 2. වර්ෂාව, සූර්යතාපය, සුළඟ
3. සූර්යතාපය, විදුලි කෙටීම, ගෙරවීම 4. සූර්යතාපය, වර්ෂාව, ගස් කඩා වැටීම

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1). ස්වයං රැකියා ක්ෂේත්‍රයේ නව පෙරළියක් ඇති කිරීමේ අරමුණින් පාසැලෙන් සමාජයට පිවිසෙන දරුවන් ඉලක්ක කර ගනිමින් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ 'දිනෙක දිළෙමු - ලොව ජයගමු' යන තේමාව යටතේ පැවති නිර්මාණ හා අලෙවි ප්‍රදර්ශනය කාගේත් අවධානයට යොමු වී තිබුණි.

(i). ඉහත ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කළ කර්මාන්ත ක්ෂේත්‍ර 04 ක් නම් කරන්න.

(ii). එම එක් කර්මාන්ත ක්ෂේත්‍රයක් යටතේ පැවති ප්‍රදර්ශන භාණ්ඩ 02 ක් නම් කරන්න.

(iii). ප්‍රදර්ශනයේ ප්‍රචාරක දැන්වීම් පෝස්ටරය නිර්මාණය කළේ ඔබ යැයි සිතා සුදුසු පෝස්ටරයක් ඇඳ දක්වන්න.

(iv). විවිධ ක්‍රම යටතේ අලංකරණය වූ මැටි භාණ්ඩ දෙසට කාගේත් අවධානය යොමු වී තිබුණි. ඔබ දන්නා මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම 02 ක් නම් කරන්න.

(v). ගොක්කොළ උපයෝගී කරගෙන ඉතා අලංකාර පුන්කලස් නිර්මාණය කර තිබුණි. මෙම පුන්කලස් අලංකාර කිරීමට යොදාගත් වෙනත් ස්වභාවික අමුද්‍රව්‍ය 02 ක් නම් කරන්න.

(vi). අතින් පින්තාරු කිරීම යටතේ සාරි මෝස්තර රැසක් අලෙවිය සඳහා ඉදිරිපත් කර තිබුණි. එම ක්‍රමය යොදාගෙන සාරි පල්ලුවක් නිර්මාණය කිරීමට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ දෙකකින් පමණක් වර්ණ ගන්වන්න.

(vii). කැබලි රෙදි යොදාගෙන සිදු කල පැච්වර්ක් නිර්මාණ ඉතා ඉක්මනින් අලෙවි විය පැච්වර්ක් ක්‍රමය යටතේ සිදුකළ කුෂන් කවර මෝස්තරයක් ඇඳ වර්ණ ගන්වන්න.

(viii). වැඩි වටිනාකමකින් යුතු පිත්තල භාණ්ඩ අලෙවි කළ කුටි කිහිපයේම විවිධ පිත්තල භාණ්ඩ දක්නට ලැබුණි. එහි දක්නට ලැබුණු පිත්තල භාණ්ඩ 04 ක් ලියා දක්වන්න.

(ix). රෙදිපිළි අලංකරණ ක්‍රම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා උපකරණ රැසක් ද අලෙවි කිරීමට සූදානම් කර තිබුණි. එවැනි ද්‍රව්‍ය හා උපකරණ 04 ක් නම් කරන්න.

(x). විශාල ප්‍රමාණයේ පිත්තල පහනක් අලෙවි කිරීමේ දී 30,000/- ක මුදලකට මිල නියම කළ අතර ප්‍රදර්ශන කුටියේ රැඳී සිටින පුද්ගලයාට අලෙවි වන සෑම භාණ්ඩයකින්ම 5% ක මුදලක් ලබා දීමට තීරණය කර තිබුණි. එලෙස පිත්තල පහනක් අලෙවි කිරීමෙන් ඔහුට ලැබෙන මුදල කීයද ?

(ලකුණු 2 x 10 = 20)

2). ජ්‍යාමිතික ඇඳීම රේඛා වලින් හා සංකේත රාශියකින් සමන්විත වූ විශ්ව භාෂාවක් ලෙස හැඳින්වේ.

(i). ජ්‍යාමිතික ඇඳීම් දෙයාකාරයකි. එම ආකාර දෙක දක්වා එයට උදාහරණ එක බැගින් ඇඳ දක්වන්න. (ල.2)

(ii). පාදයක දිග 4 cm වූ සවිධි ෂඩස්‍රයක් ඇඳ දක්වන්න. (ල.3)

(iii). විහිත චතුරස්‍ර යුගල භාවිතා කර පහත සඳහන් කෝණ නිර්මාණය කරන්න.

1. $60^0$ 2. $120^0$ 3. $75^0$
4. $135^0$ 5. $15^0$ (ල.5)

3). රෙදිපිළි මුද්‍රණ ක්‍රියාවලියේ ප්‍රධාන මාධ්‍යයක් වන සායම් වර්ග හා වර්ණ සංකලනය පිළිබඳ දැනුවත්වීම ඉතා වැදගත්ය.

(i). රෙදිපිළි අලංකරණයේදී වර්ණගන්වන ක්‍රමවේද තුනකි. ඒ මොනවාද ? (ල.2)

(ii). අතීතයේදී වර්ණ ලබා ගැනීමට භාවිතා කළ පාරිසරික සම්පත් තුනක් ලියන්න. (ල.3)

(iii). ඉහත දක්වන ලෙස ස්වභාවික සායම් භාවිතය වර්තමානයේදී දක්නට නොලැබේ. ඊට හේතු වූ මූලික කරුණු 05 ක් ලියන්න. (ල.5)

4). රෙදිපිළි අලංකාර කිරීමට සුදුසු තත්වයට පත්කර ගැනීම පෙරපිරියම් කිරීමයි.

(i). පෙරපිරියම් කිරීමේ ක්‍රම 02 ක් නම් කරන්න. (ල.2)

(ii). පසු පිරියම් කිරීමේ ක්‍රියාවලිය යනු කුමක්දැයි හඳුන්වා එම ක්‍රියාවලියේ දී සැලකිලිමත් විය යුතු කරුණු 02 මොනවාද ? (ල.3)

(iii). ඔබ දන්නා විසිතුරු පිළිඅලංකරණ ක්‍රමයක් උපයෝගී කරගෙන බිත්ති සැරසිල්ලකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න. (ඔබ තෝරාගන්නා පිළිඅලංකරණ ක්‍රමය කුමක්දැයි දක්වන්න. රූපසටහන ඇසුරෙන් විස්තර කරන්න.)

(ල.5)

5). රෙදිපිළි නිෂ්පාදන ක්‍රියාවලිය යටතේ පෙහෙකම් කෙඳි වර්ගීකරණය ඔබ ඉගෙන ගෙන ඇත.

(i). ඒ අනුව කෘතිම කෙඳි වර්ග කර ඇත්තේ කෙසේද ? (ල.2)

(ii). උසස්ම වර්ගයේ ලෝම කෙඳි ලබා ගන්නා බැටළුවා ඇතුළු තවත් බැටලු වර්ග 02 ක් නම් කරන්න. (ල.3)

(iii). ඛනිජ කෙඳි වර්ග 02 ක් නම් කර ඇස්බැස්ටෝස් කෙඳි පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල.5)

6). ''විවීම් රටා'' යනු දික් - හරස් නූල් අතර ඇතිවන බැඳීම ගොඩනැගී ඇති ආකාරයයි.

(i). චාම් වියමන් රටාවේ ප්‍රභේද 04 නම් කරන්න. (ල.2)

(ii). දික් නාරටි වියමන ලෙසින් ද හඳුන්වන දික්දාර වියමනට අදාළ වියමන් රටාව ඇඳ දක්වන්න. (ල.3)

(iii). හැඩ පෙති ආධාරයෙන් පටියක් වියා ගැනීමේ දී භාවිතා කල හැකි නූල් වර්ග 02 ක් නම් කර හැඩ පෙත්තක රූපසටහනක් ඇඳ දක්වන්න.

(ල.5)

7). මානව ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමඟම පැවත එන කලාවක් ලෙස මැටි ශිල්පය හැඳින්විය හැක.

(i). මැටි ජීර්ණය වීමට බලපාන හේතු සාධක 02 ක් නම් කරන්න. (ල.2)

(ii). මැටි වල භෞතික හා රසායනික ගුණාංග 02 ක් ලියා ඉන් එක් ගුණාංගයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් ලියන්න. (ල.3)

(iii). මැටි දරණු භාවිතා කර මල් පෝච්චියක් නිර්මාණය කරනා ආකාරය රූපසටහන් ඇසුරෙන් විස්තර කරන්න.

(ල.5)